# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2399/43 - 2024 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2024.08.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### *ඌව පළාතේ පළාත් සභාව*

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහය

**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ විනය පාලනය පිළිබඳව සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික වන කරුණු පිළිබඳව විධිවිධාන සැලසීම සඳහා වන විනය කාර්ය සංග්‍රහය**

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) හා 32(3) වගන්ති ප්‍රකාරව, ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ.ජේ.එම්. මුසම්මිල් වන මා වෙත පැවරී ඇති බලතල අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ විනය පාලනය පිළිබඳව සහ ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික වන කරුණු පිළිබඳව විධිවිධාන සැලසීම සඳහා වන මෙම ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහය 2024 වර්ෂයේ සැප්තැම්බර් මස 01 වැනි දින සිට බලාත්මක වන පරිදි පනවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1762/33 හා 2012.06.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත, 2012.06.01 දින සිට බලාත්මකව පවතින ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහය, ඒ මත ගන්නා ලද හෝ ගන්නා ලදැයි සැලකෙන සියලු තීරණ සහ ක්‍රියාමාර්ගවලට අගතියක් නොවන පරිදි 2024 වර්ෂයේ සැප්තැම්බර් මස 01 වැනි දින සිට අවලංගු කරනු ලැබේ. එම විනය කාර්ය සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, ආරම්භ කර ඇති හෝ අවසන් කර ඇති විනය ක්‍රියාමාර්ගවලට මෙම අභිනව විනය කාර්ය සංග්‍රහයේ විධිවිධාන කුමන ආකාරයකින් හෝ බාධාවක් නොවනු ඇත.

**ඒ.ජේ.එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2024 අගෝස්තු මස 26 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
රජ වීදිය,
බදුල්ල.

EOG 08 - 0352